# බළන්ගොඩ නගර සභාව

## 2020-10-15 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව

දිනය - 2020.10.15

වේලාව - පෙ.ව. 10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.

සහභාගීත්වය

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් විකුමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලකා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

නිළධාරි සහභාගීත්වය

| | |
|---|---|
| 1. ලේකම් | එස්.එච්.ඒ.කරුණාරත්න මිය |

01. පසුගිය මහ සභාවේ සභා වාර්තාව හා විශේෂ මහ සභාවේ සභා වාර්තාව සභා සම්මත කිරීම.

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, අද දින සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගැනීමෙන් අනතුරුව 2020-09-15 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2020-10-30 දින පැවති විශේෂ මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් 2020-09-15 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2020-10-30 දින පැවති විශේෂ මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි ගරු සභාපතිතුමා විමසා සිටි අවස්ථාවේදී ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් 2020-09-30 දින පැවති විශේෂ මහ සභාවේ සභා වාර්තාවේ පොදු වෙළෙඳසැල අංක 16 දරණ එළ හරක් මස් කඩ කාමරය 2021 වර්ෂයට බදුදීමට අදාළ යෝජනාව ඉදිරිපත් කිරීමේදී (පිටු අංක 02) **"මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා"** යනුවෙන් සටහන්ව ඇති ස්ථානය **"ගරු සභාපතිතුමා යෝජනාව සභාගත කරමින්"** යනුවෙන් වෙනස් විය යුතු බවද, පොදු වෙළෙඳසැල හරක් මස් කඩ කාමරය සඳහා විවෘත ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමට ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා, ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා විරුද්ධත්වය ප්‍රකාශ කළ නමුත් එය සටහන් වී නොමැති බව පවසන ලදී.

ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා වාර්තා සභා සම්මත විය.

02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන

- 2021 වර්ෂයේ අයවැය සකස් කිරීම සඳහා මෙතෙක් යෝජනා ලබා නොදුන් ගරු මන්ත්‍රීතුමන්ලා 2020-10-30 දිනට පෙර යෝජනා ලබා දෙන මෙන් ඉල්ලා සිටින ලදී. ලබන වසර තුළදී ක්‍රියාත්මක කරනු ලබන්නේ එම යෝජනා පමණක් වන අතර ඒ සඳහා මුදල් වෙන් කිරීම අයවැය තුළින් සිදු කරන බව පවසන ලදී.

03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම

- ජෙයිලානි ජාතික පාසලට ඇතුළත් වන ප්‍රධාන දොරටුවේ ඇති මාර්ගය ඉතාම ජනාකීර්ණ මාර්ගයක් වන අතර දැනට එහි වල් බිහි වී ඇති බවද මාර්ගයේ ඇති විශාල වලවල් නිසා පාසලට යන ළමුන් අපහසුතාවයට පත්වන බැවින් මෙම මාර්ගය සකස් කර දෙන මෙන් ර/ ජෙයිලානි ජාතික පාසල විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.
- අංක 10 A, කරවිකැටිය, බලන්ගොඩ ලිපිනයෙහි පදිංචි එස්.කේ.කසුන් මධුසංක මහතාගේ නිවසේ අප ජලය බැහැර කරන එකම ස්ථානය වන්නේ නගර සභාවේ කාණුව වන නමුත් මේ වන විට එම

කාණුව වැසී ගොස් ඇති බැවින් එම කාණුව සකස් කර දෙන මෙන් ඉල්ලා තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

❖ නව බස්නැවතුම්පළ සී - 02 දරණ කඩ කාමරය අසළ ඇති වැහි පීල්ල දිරාපත්ව ඇති අතර ඒ හේතුවෙන් වැසි කාලයේදී මහජනතාව මෙන්ම වෙළෙඳ ව්‍යාපාරිකයින්ද දැඩි අපහසුතාවයකට පත්ව ඇති බැවින් එය සකස්කර දෙන ලෙස නව බස්නැවතුම්පල සී - 05 කඩ කාමරයේ බදුකරු වන ඩබ්.ජී.එන්.සමරසුන්දර යන අය විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

❖ දැනට රටේ උද්ගත වී ඇති කොවිඩ් 19 වෛරස ව්‍යාප්තිය හේතුවෙන් සෞඛ්‍ය උපදෙස් මත 2020-10-07 දින සිට බළන්ගොඩ තානායමේ රටබීම හළ වසා තැබීමට, උත්සවශාලා පවත්වාගෙන යාමට, නවතැන් පහසුකම් ලබාදීමට අවසර ලබා දී නොමැති බැවින් තානායම කුළි ගෙවීම සම්බන්ධයෙන් සහනයක් ලබා දෙන මෙන් තානායම් ටෙන්ඩර්කරු විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

දැනට පවතින කොවිඩ් 19 වෛරසය ව්‍යාප්තිය හමුවේ තානායමේ අදායම අහිමි වීම නිසා තානායම් කුලිය අය කර ගැනීම සඳහා සහනයක් ලබා දිය යුතු බව සභාවේ මතය විය. එබැවින් ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා යෝජනාවක් ඉදිරිපත් කරමින් 2020-10-07 වන දින සිට මීළඟ සභාව පවත්වන දින දක්වා තානායම් කුළිය අය නොකර සිටීම සුදුසු බවට පැවසූ අතර ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ 2020-08-05 දින පැවති මහ මැතිවරණය හේතුවෙන් 2020-08-05/06/07 යන තෙදින තුළ බස් රථ ධාවනය නොවූ බැවින් බස්රථ ටෙන්ඩර් ගාස්තු අය කිරීමෙන් නිදහස් කර දෙන ලෙස බස් ගාල් ගාස්තු අය කිරීමේ ටෙන්ඩර්කරු වන එම්.උදය ශාන්ත මහතා ඉල්ලා තිබූ ලිපිය ගරු සභාපතිතුමන් සභාගත කරන ලදී.

❖ කොටුගොඩැල්ල මෛත්‍රී බෝධි මළුවේ ටයිල් ඇතිරීම සඳහා හා බෝධි මළු භූමියේ ඉන්ටර්ලොකින් ගල් ඇතිරීම සඳහා වැයවන මුදල් ප්‍රතිපාදන සභාවෙන් ලබා දෙන ලෙස මෛත්‍රී බෝධි සංගමය විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා මෙවැනි කාර්යයන් සභාවේ විෂය පථය තුළ නොමැති බැවින් මේ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන්කිරීමේ හැකියාවක් නොමැති බව ද ආණ්ඩුකාරතුමා හරහා ඉල්ලීමක් සිදු කිරීම සුදුසු බව ද පවසන ලදී.

❖ කොටුගොඩැල්ල කරව්කැටිය වෑ කුඹුර ප්‍රදේශවාසීන්ගේ අවමංගල්‍ය අවශ්‍යතා සඳහා දැනට වසර 120 ක පමණ සිට ප්‍රයෝජනයට ගන්නා උඩකන්ද ප්‍රදේශයේ පිහිටා ඇති සුසාන භූමිය ඉතා දුෂ්කර ස්ථානයක පවතින අතර ඒ සඳහා ගමන් ගන්නා මාර්ගය ඉතා දුෂ්කර බවත් එබැවින් ඊට පඩි වලින් අත් වාරුවක් සමඟින් නිම කල මාර්ගයක් සකස් කර ගැනීම සඳහා සභාවේ අනුමැතිය හා මුදල් ප්‍රතිපාදන අනුමත කර දෙන ලෙස කොටුගොඩැල්ල වෑ කුඹුර ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ශාඛා සභාපති ධනපාල වඩුමේස්ත්‍රිගේ මහතා විසින් එවූ ලිපිය සභාගත කරන ලදී.

❖ වරිපනම් අංක 2 E,4 සහ 12 B දරණ දෙමහල් ගොඩනැගිලි දොරවෙල ඔයට මායිම්ව පිහිටා ඇති අතර පසුගිය දින ඇති වූ ගංවතුර හේතුවෙන් නගර සභාව විසින් දොරවෙල ඔයට එස්කැවේටර් යන්ත්‍රයක් යොදා ඉවුරු පුළුල් කිරීම හා ගැඹුර වැඩි කිරීම සිදු කරන අවස්ථාවේදී එම ගොඩනැගිලිවල ආරක්ෂාවට ඉදිකර තිබූ පැති බැම්මේ අත්තිවාරම පෑදී ඇති බැවින් දොරවෙල ඔයට

මද දුරක් ඉදිකර නවතා ඇති පැති බැම්ම ( ග්‍රේබියල් වෝල්) තව මීටර් 50 ක් පමණ දුරකට ඉදි කර දෙන ලෙස එල්.ටී.එච්.චන්ද්‍රලාල්, එල්.ටී.එච්.හේමචන්ද්‍ර, කේ.ජී.නිමල් කරුණාරත්න යන අය විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා

❖ වැවවත්ත උද්‍යානයේ පිහිටි ප්‍රජා ශාලාව පිටුපස ඇති හිස් ඉඩම් කොටස වැවවත්ත උද්‍යානයේ ප්‍රජා එකමුතු සමිතිය සඳහා රැස්වීම් හා පොදු කටයුතු පැවැත්වීමට ලබා දෙන ලෙස වැවවත්ත ප්‍රජා එකමුතුව විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.

04. කල් දී ඇති ප්‍රශ්න

04.01 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා

04.01.01 පුස්තකාලයේ උපදේශන සභාව විසින් ඉදිරිපත් කළ යෝජනා වලින් පටන් ගත් යෝජනා කවරේද?

(Smart library , බැහැර දෙන අංශයේ වායු සමීකරණය, නිති රීති ඇතුළත් අත්පොත මුද්‍රණය, වැසිකිළි දොරවල් අළුත්වැඩියාව, බිත්ති රාක්ක, වෝල් ෆෑන්, පිටපතක් සඳහා රු. 5.00 ගාස්තුව) පුස්තකාලය දැනට වසා ඇති නිසා අළුත්වැඩියා කටයුතු මේ දිනවල කිරීමට උනන්දු වන්න.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා Smart library වැඩ කටයුතු සිදු කරගෙන යන බවද බැහැර දෙන අංශයේ වායු සමීකරණය, බිත්ති රාක්ක වැඩ කටයුතු ඉටු වී නොමැති බවද ඉතිරි වැඩ සියල්ල සිදු කර ඇති බව ද පවසන ලදී.

04.02 ගරු නාගරික මන්ත්‍රිනී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය

04.02.01 බලන්ගොඩ, උඩ ඇල්ලේපොල සරස්වතී පාර සුසාන භූමියෙහි ඉදිකරනු ලබන ගොඩනැගිල්ලෙහි ප්‍රගතිය විමසා බැලීම.

මෙහිදී පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා ඉහත කර්මාන්තයේ කටයුතු 60% ක් පමණ ඉටු කර ඇති බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය අදහස් දක්වමින් තමන්ගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් ඉතිරි වී ඇති මුදල් සියල්ල මේ සඳහා යොදවන ලෙස පවසන ලදී.

05. කල් දී ඇති යෝජනා

05:01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා

05.01.01 නාගරික මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ පහත සඳහන් මන්ත්‍රීවරුන් සඳහා සමිතිවලට ලබාදීමට අවශ්‍ය ප්ලාස්ටික් පුටු මිළදී ගැනීම සඳහා තිල්කමල් ආයතනයෙන් ලැබී ඇති රු.850.00 ක (ඒකක මිල) අවම මිළ ගණන අනුමත කර ගැනීම.

ගරු උප සභාපති එම් ටී.එම්.රූමි මැතිතුමා - ප්ලාස්ටික් පුටු 110

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා - ප්ලාස්ටික් පුටු 130

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.02 බස්නැවතුම්පල උඩු මහලේ නව විදුලි සැපයුම ලබා දීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලැයිස්තුව අනුමත කර ගැනීම.

| වර්ගය | ප්‍රමාණය |
|---|---|
| 1044 වයර් දුඹුරු | 50m |
| 1044 වයර් නිල් | 50m |
| 15 A වයර් | 20m |
| අර්ත් වයර් | 20m |
| ට්‍රිප් ස්විච් | 01 |
| මේන් ස්විච් | 01 |
| 10A බ්‍රේකර් | 02 |
| 6 A බ්‍රේකර් | 01 |
| 13 A ප්ලග් | 03 |
| ඩබල් සන් බොක්ස් | 01 |
| සින්ගල් සන් බොක්ස් | 02 |
| ටූ ගැන් ස්විච් | 01 |
| 1" කේෂින් | 07 |
| රෝල් ප්ලග් 6mm | 60 |
| ඇණ | 60 |
| සිවිලින් රෝස් | 04 |
| හෝල්ඩර් | 04 |
| ටු කෝර් වයර් | 02m |
| 500 ABC බොක්ස් | 01 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.03 විදුණැන පියසා වායු සමීකරණ පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා Gemcity Treaders ආයතනයේ රු.18,200.00 ක මුදල අනුමත කර ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.04 කාර්යාලයේ වායු සමීකරණ පද්ධති (ගණකාධිකාරි කාමරය, සභාපති කාමරය, මන්ත්‍රී කාමරය, සභාව, රැස්වීම් ශාලාව, හා ආයුර්වේදය) සේවා කිරීම සඳහා Gemcity Treaders ආයතනයේ රු.19,200.00 ක මිළ ගණන් අනුමත කිරීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.05 සභාවේ සිට පුස්තකාලය දක්වා Network Cable මඟින් සම්බන්ධතාවය ලබා දීම වෙනුවෙන් Wisdom Computer Technologies ආයතනයේ රු.12,145.00 ක මිළ ගණන අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.06 කර්මාන්ත අංශය සඳහා නව පරිගණකයක් මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.07 නගර සභා අයවැය මඟින් මාතෘ හා ළමා සංරක්ෂණය වෙනුවෙන් වැය කර ඇති මුදලින් නගර සභා සීමාවට අයත් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හා පවුල් සෞඛ්‍ය සේවා නිළධාරීන් සඳහා රු.75,000.00 ක ලිපි ද්‍රව්‍ය ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.08 පුස්තකාල කමිටුව මඟින් නිර්දේශ කරන ලද යෝජනා සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- 2020 ජාතික කියවීම් මස වැඩසටහන් පැවැත්වීම.
- මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම.
- විශ්ව විද්‍යාල සිසුන් සඳහා අවශ්‍ය පොත් මිළදී ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.09 ගබඩා අවශ්‍යතා සඳහා පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

| වර්ගය | ප්‍රමාණය |
|---|---|
| ඉදල් | 100 |
| කලු කවර (කුණු දැමීමට) | 1000 |
| ටර්ටකෝර් (මැස්සන්ට) | පැකට් 25 |
| ස්ටෙප්ලර් මැෂින් | 10 |
| සර්වියට් | 20 |
| පේපර් ක්ලිප් | පැකට් 50 |
| Air Freshner | 10 |
| Finol | 10 |
| මාස්ක් | 200 |
| සෙලෝටේප් (ලොකු) | 30 |
| සෙලෝටේප් (පොඩි) | 30 |
| ඩබල් ටේප් | 10 |
| ලොකු ලියුම් කවර | 200 |
| ෆයිල් කවර | 500 |
| බුවුන් පේපර් | 100 |
| පොලිතීන් | 5Kg |
| ග්ලාස් ක්ලීනර් | 24 |
| Epson LQ 2190 Original Ribbon | 03 |
| NPG 28 Toner | 03 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදිශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05.01.10 කර්මාන්ත අංශය සඳහා අවශ්‍ය පහත සඳහන් උපකරණ ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

කාර්යාල මේස - 01 (දිග 3'.9"X පළල 2')

නිළධාරී පුටු - 01

පරිගණක මේස - 01 (KCT 011)

කුඩා පොත් රාක්ක - 01

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.11 බැංකියවත්ත කොම්පෝස්ට් අංගනයේ තීන්ත ආලේප කිරීම සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| වර්ගය | ප්‍රමාණය |
|---|---|
| Wall Filler | 20 L |
| Poppy (Enamal) | 20 L |
| Spruce (Enamal) | 20 L |
| Banyan Tree (Enamal) | 20 L |
| Off White | 08 L |
| Lily White | 08 L |
| Cement Bag | 03 |
| 4" පින්සල් | 02 |
| තීන්ත රෝලර් | 01 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.12 බස්නැවතුම්පල වැසිකිළි අලුත්වැඩියාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| වර්ගය | ප්‍රමාණය |
|---|---|
| 3/4 L-Iron | 06 |
| Rejin Sheet | 19 ft |
| කොලා පේපර් | 25 ft |
| Cutting Wheel 4" | 05 |
| 4X3 ඇලුමිනියම් සරනේරු | 08 |
| සොයිබ 2" | 04 |
| හැඩල් | 04 |
| 1/4 රෝල් ප්ලග් | පෙට්ටි 01 |
| 1/4 කොන්ක්‍රීට් විදින කටු | 02 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05.01.13 HF-7899 JCB යන්ත්‍රයේ පහත සඳහන් අලුත්වැඩියා සිදු කිරීම සඳහා තෙබුවන ගරාජ් වෙතින් ඉදිරිපත් කර ඇති රු.51,600.00 ක අවම මිළ ගණන අනුමත කර එම ආයතනයෙන් අදාළ සේවාව ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- බැටරියට මේන් ස්විච් එකක් දැමීම
- ආම් එක එසවෙන ජැක් එකට පින් එකක් දැමීම.
- රේඩියේටර් ෆෑන් එක අලුත්වැඩියා කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05.01.14 නගර සභා බල ප්‍රදේශයකට අයත් කැඩැස්තර සිතියමේ මුද්‍රිත පිටපතක් රත්නපුර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී කාර්යාලයෙන් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05.01.15 නව බස්නැවතුම්පල බී-04 කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, මෙම කඩ කාමරයේ වර්තමාන බදු ගැනුම්කරු වන චමින්ද ප්‍රසාද් සමරසිංහ යන අය විසින් අබ්දුල් රසාක් මොහොමඩ් අසීක් යන අය වෙත අතුරු බදු දී ඇති බව අනාවරණය වී ඇති බවද මෙය කී මනි කඩ කාමරයක් බැවින් පළාත් පාලන කොමසාරිස්ගේ 1/2009 චක්‍රලේඛය ප්‍රකාරව කීමනි මුදලින් 25% ක් අයකර ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු අදාළ කඩ කාමරය අතුරු බදුකරුට පැවරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදි. ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු කීමනි මුදලින් 25% ක මුදලක් අය කර අතුරු බදුකරු වන අබ්දුල් රසාක් මොහොමඩ් අසීක් යන අය වෙත කඩ කාමරය ලබා දීමට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.17 VI -1833 යතුරු පැදියේ එන්ජිම අලුත්වැඩියා කිරීම සඳහා ඉන්දික මෝටර්ස් වෙතින් ඉදිරිපත් කර ඇති රු.40,412.00 ඇස්තමේන්තුව අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ඉටුකර ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.18 QL - 2901 ත්‍රීරෝද රථයේ පහත අළුත්වැඩියා කිරීම සඳහා චමින්ද මොටර්ස් වෙතින් ලැබී ඇති රු.42,600.00 ක අවම මිළ ගණන අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ඉටුකර ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීම.

- ඉදිරිපස අසුන අලුතින් සෑදීම.
- පිටුපස අසුන අළුත්වැඩියා කිරීම.
- ඉදිරිපස හා පිටුපස සංඥා ලාම්පු අළුතින් දැමීම.
- ඉදිරිපස බිඩින් සහ වීදුරු රාමු අළුතින් දැමීම.
- පිටුපස අපොස්ටින් දෙක අළුතින් දැමීම.
- දැනට පවතින වින්ඩ්ස්ක්‍රීන් එක භාවිතයට අපහසු බැවින් එය තනි වීදුරුව සහිත වින්ඩ්ස්ක්‍රීන් එකකට මාරු කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.19 බළන්ගොඩ නගර සභාව සතු වාහන 2020/2021 වර්ෂය සඳහා රක්ෂණය කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.ප්‍රේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.20 සභාව සතු වාහන සඳහා අවශ්‍ය පහත සඳහන් ටයර් මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| වර්ගය | ප්‍රමාණය |
|---|---|
| 205x16(265x70) | 4 |
| 750x16(12RP) | 10 |
| 700x16(12RP) | 6 |
| 700x15(8RP) | 4 |
| 700x15(12RP) | 4 |
| 825x16(12RP) | 6 |
| 12.28(10RP) | 10 |
| 13.28(02RP) | 8 |
| 600x16(10RP) | 10 |
| 650x10(10RP) | 10 |
| 17.5x14(12RP) | 2 |
| 19.5x24(12RP) | 2 |
| 12.5x80x16(12RP) | 2 |
| 16.9x28(12RP) | 2 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනි එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.21 සභාව සතු වාහන සඳහා අවශ්‍ය ටියුබ් සහ කොලර්ස් ලබා ගැනීමට අනුමැතිය ලබා ගැනීම.

| වර්ගය | ප්‍රමාණය |
|---|---|
| 750x16 Collars | 10 |
| 700x15 Collars | 4 |
| 825x16 Collars | 4 |
| 750x16 Tube | 12 |
| 700x16 Tube | 12 |
| 825x16 Tube | 12 |
| 12.28 Tube | 12 |
| 13.28 Tube | 12 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05.01.22 2020 ඔක්තෝම්බර් මස කර්මාන්ත අංශය මඟින් සිදුකිරීමට අපේක්ෂිත නඩත්තු සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

01. දෙණියකුඹුර පාර දෙවන වර තාර දැමීම.

02. දංගමුව වලව්ව පාර දෙවන වර තාර දැමීම.

03. තලාව පාර දෙවන වර තාර දැමීම.

04.මිරිස්කොටුව පාර දෙවන වර තාර දැමීම.

05. සඳුන්ගම හංදියේ ධනසිරි මහතාගේ නිවස මාර්ගය ජේසීබී යන්ත්‍රය මඟින් පාර කපා සකසා දීම.

06. කිරිඳිගල මැද පාර (බුද්ධ ජයන්ති පාර) සුද්ධ කරදීම.

07.ඕළුගංතොට ගඟට බසින පඩිපෙළ ශුද්ධ කර අළුත්වැඩියා කිරීම.

මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය ද්‍රව්‍ය

| | |
|---|---|
| තාර බැරල් | 100 |
| 11/2 ගල් කියුබ් | 15 |
| මි.මී.10 කම්බි | 20 |
| චිප් ගල් කියුබ් | 15 |
| සිමෙන්ති | 50 |

*මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය කම්කරුවන් ප්‍රමාණය*

දිනකට සේවකයන් 15 බැගින් දින 25 කට කම්කරුවන් 375ක් අවශ්‍ය වේ.

*මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය රථවාහන*

ටිපර් රථය දින 25

ට්‍රැක්ටර් රථය දින 25

D/D රෝල දින 15

JCB යන්ත්‍රය පැය 50

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.23 බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතිය උප කාර්යාලයක් ලෙස නවීකරණය කිරීම සඳහා සහ ඒ සඳහා අවශ්‍ය ලී බඩු උපකරණ, ඉදිකිරීම් හා නඩත්තු ද්‍රව්‍ය, විදුලි සැපයුම් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| වර්ගය | ප්‍රමාණය |
|---|---|
| බ්ලොක් ගල් | 65 |
| සිමෙන්ති | 03 |
| වැලි | 02 |
| මුදුන් උළු | 07 |
| පොටි බැග් | 01 |
| පිලර් | 04 |
| බ්‍රිලියන්ට් වයිට් | 04 |
| ඕෆ් වයිට් | 08 |
| එනමල් ප්ලේන්ට් | 02 |
| ෆ්ලෝ ප්ලේන්ට් කළු | 04 |
| තිනර් | 04 |
| පිවීසී පයිප්ප 1/2 | 04 |
| 1/2 එල් බෝ | 04 |
| 1/2 ටෙප්සිල් | 02 |
| 3/4 පට්ටම් | 16 |

| | |
|---|---|
| 3/16 ඇණ පැකට් | 01 |
| කටින් වීල් | 10 |
| වැල්ඩින් කූරු 12 | 02 |
| ස්ලෝත් ගම් පොඩි | 01 |
| 18 w LED සිවිලින් ලයිට් | 03 |
| හෝල්ඩර් | 04 |
| 12 w LED බල්බ් | 05 |
| සින්ගල් සන් බොක්ස් | 03 |
| 13 A ප්ලග් පොට්ස්ට් | 03 |
| 1.044 දුඹුරු | 50m |
| 1.044නිල් | 50m |
| අර්ත් වයර් | 20m |
| 1/2 බොක්ස් බාර් | 1 |
| කාර්යාල මේස | 03 |
| කාර්යාල පුටු | 03 |
| හිටවන විදුලි පංකා | 01 |
| තේ පැන් පිළියෙල කිරීමේ උපකරණ කට්ටල | 01 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.24 **බේල් මැෂින් එක සඳහා පිරිවිතර අනුමත කර ගැනීම.**

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙහි ක්‍රියාවලිය පැහැදිලි කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදි.

කාර්මික නිළධාරීතුමාගේ කරුණු පැහැදිලි කිරීමෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.26 බැංකියවත්ත කොම්පෝස්ට් අංගනයේ වහලේ දිරාගිය කොටස් අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.27 තුරු උයන සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| | |
|---|---|
| 6 x 9 ගල් කියුබ් | 10 |
| වැලි කියුබ් | 05 |
| සිමෙන්ති මිටි | 50 |
| 10mm කම්බි | 30 |
| කොන්ක්‍රීට් වැට කණු අඩි 6 උස | 40 |
| PVC Cortard Wire Mesh 5' | 300m |
| PVC Coreard Bared wire | 500m |
| 2" GI Pipe | 07 |
| 1" GI Pipe | 27 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.28 බස්නැවතුම්පල පොදු වැසිකිළියේ මළාපවාහන පිරිපහදු පද්ධතිය සකස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදිශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.29 37-7933 ට්‍රැක්ටර් බවුසරයේ වතුර මෝටරය අලුත්වැඩියා කිරීම සඳහා තෙබුවන ගරාජයේ රු.12,850.00 ක මිළ ගණන අනුමත කර ගැනීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05.01.30 බස්නැවතුම්පල අංක සී - 11/01 දරණ කඩ කාමරය ටෙන්ඩර් කිරීම සඳහා සහ එම කඩ කාමරය සඳහා විදුලි සැපයුම් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

බස්නැවතුම්පල අංක සී - 11/01 දරණ කඩ කාමරය ටෙන්ඩර් කිරීම සඳහා රු.10,000.00 ක මුදලක් අවම ලංසු මුදල ලෙස යොදා සීමිත ටෙන්ඩර්පත් කැඳවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.31 නව බස්නැවතුම්පල සී-46 දරන කඩ කාමරයේ ගිවිසුම් ඇප තැන්පත් ලෙස තැම්පත් ඇති රු.24,200.00 මුදල, එම කඩ කාමරයේ විදුලි බිල්පතෙහි හිඟ මුදල ලෙස පවතින රු.22,475.00 ට හිලව් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.32 නව බස්නැවතුම්පොල වෙළෙඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා ජල ගාස්තුව අය කිරීම සම්බන්ධව සභා තීරණයක් ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මේ පිළිබඳව සභාවේ සිදු වූ දීර්ඝ සාකච්ඡාවෙන් අනතුරුව ජල සම්පාදන මණ්ඩලය විසින් ඒකකයක් සඳහා අය කරන මුදල අය කර, ඊට අමතරව රු.200.00 ක සේවා ගාස්තුවක් අය කිරීම සුදුසු බව සභාවේ මතය විය.

එබැවින් නව බස්නැවතුම්පල වෙළෙඳ සංකීර්ණයේ එක් කඩ කාමරයකින් ජල ඒකකයක් සඳහා ජල සම්පාදන මණ්ඩලයෙන් අයකරන මුදල අය කර, සේවා ගාස්තු ලෙස රු.200,00ක මුදලක් අය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුෂ්මි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.33 ජේසීබී රථය කුලියට ලබා ගැනීම සඳහා එච්.ජී.බී.එල්.අබේරත්න යන අය විසින් රු.11,250.00 ක මුදලක් ගෙවා තිබූ අතර එම සේවාව ලබා නොගැනීම මත අදාළ මුදල ආපසු ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.34 2020-07-16 දින පැවති මහ සභාවේ අනුමත වූ පරිදි ඩබ්.එල්.ආනන්ද යන අය වෙත නව පදික කඩයක් ලබාදීම සඳහා ගාස්තු අය කර ගැනීම සම්බන්ධව සභා තීරණයක් ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා 1/2009 චක්‍රලේඛය පරිදි කඩ කාමරයක් ලබාදිය හැක්කේ ටෙන්ඩර් කර හෝ කී මනි මුදලක් ලබා ගෙන පමණක් වන අතර ඉන් බැහැරව කඩ කාමරයක් ලබා දිය නොහැකි බවද, සභාව විසින් මේ පිළිබඳව සාමූහිකව තීරණයක් ගත යුතු බවද යම් කිසි දිනක විගණන විමසුමකට ලක්වුවහොත් සභාව විසින් මෙහි වගකීම දැරිය යුතු බවද පවසන ලදී.

මෙසේ කඩ කාමරයක් ලබා දීමේ නෛතික තත්ත්වය පැහැදිලි කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

ලේකම්තුමියගේ කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාවක් බවට පත්කරන ලදී.

සභාව සතු කඩ කාමරයක් බදු දීමේ නෛතික පදනම වනුයේ කී මනි මුදලක් ලබා ගනිමින් බදු දීම හෝ ටෙන්ඩර් කර බදු දීම වුවද ඩබ්.එල්.ආනන්ද යන අය විසින් ලබා ගෙන තිබූ කාර් පාක් අංක 06 දරණ කඩ කාමරය අතුරු බදු දී තිබූ අතර එම අතුරු බදුකරු වන අරුණි ගමගේ යන අය විසින් එවක සිටි ගරු ආණ්ඩුකාරතුමා වෙත ගොස් ඇය නමට කඩ කාමරයේ බදු අයිතිය ලබා ගත් බව ද මේ නිසා ඩබ්.එල්. ආනන්ද යන අයට එම කඩ කාමරය අහිමි වූ බැවින් අද වන විට මොහු මහත් අසරණ තත්ත්වයකට පත්ව ඇති බව ද ඇයට කීමනි මුදලක් හෝ ගෙවීමට වත්කමක් නොමැති බැවින් සානුකම්පිතව සලකා බලා

සද්භාවයෙන් යුතුව පදික කඩ හිමියන් වෙත ලබා දුන් පසු ඉතිරිව ඇති කඩ කාමරය මොහුට ලබාදීම සුදුසු බව සභාවේ මතය විය.

ඒ අනුව ඩබ්.එල්.ආනන්ද යන අයට කීමනි මුදලක් ලබා නොගෙන දිනකට රු.50.00 ක මුදලක් ලබා ගනිමින් බස්නැවතුම්පල නව පදික කඩ කාමරයක් ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමන් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.35 තෙල් ඉසින යන්ත්‍රයක් මිළදී ගැනීම වෙනුවෙන් ඉසුරු කෘෂි සේවා ආයතනයෙන් ලැබී ඇති රු.16,500.00 ක අවම මිළ ගණන් අනුමත කර ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.36 සභාව සතු වාහන සඳහා ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් බී.කේ.ජේ.පෙට්‍රෝලියම් ඉන්ධන පිරවුම්හල සඳහා රු.100,000.00 ක ඇප තැන්පතුවක් ලබා දී ඇති අතර, සභාවේ මාසික ඉන්ධන බිල්පතෙහි වටිනාකම රු.300,000.00 ඉක්මවන බැවින් තවත් රු.200,000.00 ඇප තැන්පතුවක් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.37 සභාව සඳහා අවශ්‍ය ජෙනරේටරයක් මිළදී ගැනීම සහ ඒ සඳහා රු.මිලියන 2.5 ක ඇස්තමේන්තුව අනුමත කර ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් කාර්යාලයට ජෙනරේටරයක් ලබා ගැනීම මෙන්ම බස්නැවතුම්පල සඳහා ජෙනරේටරයක් ලබා ගැනීම සුදුසු බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.38 කසළ ට්‍රැක්ටර් සඳහා හෝන් 10ක් මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.39 රු.10000.00 ට වැඩි ගෙවීම් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම.

- තුරු උයන සංවර්ධනය සඳහා බලවින්න පෙර නිමි අංගනයෙන් හියුම් පයිප්ප 15 ක් මිළදී ගැනීම වෙනුවෙන් රු.64,050.00 ක මුදලක් ගෙවීම.
- සෞඛ්‍ය අංශය සඳහා පිටපත් තුනක් සහිත ලදුපත් පොත් 300 ක් මුද්‍රණය කිරීම සඳහා රු.75,000.00 ක මුදලක් සීගිරි ප්‍රින්ටර්ස් වෙත ගෙවීම.
- ලදුපත් පිටපත් 02 කින් යුතුව පොළ පොත් 100 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් රු.27,500.00 ක මුදලක් කරුණාරත්න ප්‍රින්ටර්ස් ආයතනය වෙත ගෙවීම.
- නගර සභාවේ කෑම කාමරය සඳහා අවශ්‍ය පීරිසි කුට්ටම් කට්ටල 03 ක් මිළදී ගැනීම සඳහා ජෝති ස්ටෝර්ස් වෙත රු.11,400.00 ක මුදලක් ගෙවීම.
- පොදු වැසිකිළි දොරවල් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා පී.එම්.කේ.හාඩ්වෙයාර් වෙත රු.33,975.00ක මුදලක් ගෙවීම.
- පොළ අසළ මාලු කඩ කාමර සඳහා ජල සම්බන්ධතාවය ලබා ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම වෙනුවෙන් පී.එම්.කේ.හාඩ්වෙයාර් ආයතනය වෙත රු.14,575.00 ක මුදලක් ගෙවීම.
- නීලා බලපිටිය මහත්මියගේ නිවස අසළ බැම්ම ඉදිකිරීම සඳහා සිමෙන්ති මිටි 23 ක් මිළදී ගැනීම වෙනුවෙන් පී.එම්.කේ.හාඩ්වෙයාර් ආයතනය වෙත රු.22,885.00 ක මුදලක් ගෙවීම.
- කර්මාන්ත අවශ්‍යතා සඳහා සිමෙන්ති මිටි 25 ක් මිළදී ගැනීම වෙනුවෙන් පී.එම්.කේ.හාඩ්වෙයාර් වෙත රු.24,900.00 ක මුදලක් ගෙවීම.
- රට තුළ පවතින කොරෝනා වසංගතය හේතුවෙන් නගරය විෂබීජහරණය කිරීම සඳහා තෙල් ඉසින යන්ත්‍රයක් මිළදී ගැනීම වෙනුවෙන් ඉසුරු කෘෂි සේවා ආයතනය වෙත රු.16,500.00 ක මුදල ගෙවීම.
- කාර්යාලයේ නිලධාරීන් සහ සේවකයින් හට ඔසුපැන් ලබාදීම සඳහා අවශ්‍ය උපකරණ සාස්පාන්, ගෑස් සිලින්ඩර්, ගෑස් ලිප හා රෙගියුලේටරය මිළදී ගැනීම වෙනුවෙන් ජස්මින් ඇලුමිනියම් ඩිස්ට්‍රිබියුටර්ස් වෙත රු.17,100.00 ක මුදලක් ගෙවීම.
- LL -2110 ජල බවුසරය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ.මටෝ ක්ලීන් ආයතනය වෙත රු.16,335.00 ක මුදලක් ගෙවීම.
- RC -8183 ට්‍රැක්ටර් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් රිෂානා සර්විස් ස්ටේෂන් වෙත රු.17,980.00 ක මුදලක් ගෙවීම.
- 227-5020 ගලි බවුසරයේ ඉදිරි දුනු මිටිය ගලවා මේන් කොළය දමා හේත්තු කර බුෂ් ගසා සවි කිරීම (අවශ්‍ය ද්‍රව්‍ය යොදා) වෙනුවෙන් යූ.බී.එල්.පීරිස් ආයතනය වෙත රු.11,010.00 ක මුදලක් ගෙවීම.

- පවතින කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් නගරය විෂබීජහරණය කළ යුතුව ඇති බැවින් සෞඛ්‍ය අංශයේ ඉසින යන්ත්‍ර අලුත්වැඩියාව සඳහා ඇඹිලිපිටිය පල්ලේගම පැරකුම් කෘෂි සේවා මධ්‍යස්ථානයෙන් ස්ප්‍රේ ටැංකි සඳහා ඇතුළත පොම්ප දෙකක් මිළදී ගැනීම වෙනුවෙන් රු.10,500.00 ක් ගෙවීම.
- 2020 ජූලි, අගෝස්තු මස විශ්‍රාම වැටුප් දායක මුදල් ලෙස රු.27,202.80 ක මුදලක් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ගෙවීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.40 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.

| දිනය | විස්තරය | වවුචර් අංකය | චෙක්පත් අංකය | මුදල රු. |
|---|---|---|---|---|
| 2020.09.04 | විශ්‍රාම ගිය පුස්තකාලයාධිපති මල්කාන්ති උඩවත්ත මහත්මියගේ සේවක ඇප තැම්පත් ආපසු ගෙවීම. | 04 | 025745 | 18,235.12 |
| 2020-09-07 | මයික්‍රො ඔටෝ එයාර් කන්ඩිෂන් - ND -5124 වෑන් රථයේ වායු සමීකරණ පද්ධතිය අලුත්වැඩියා කිරීම. | 21 | 025755 | 56,425.00 |
| | ලංකා විදුලි බල මණ්ඩලය - 2020 අගෝස්තු මස පොදු වෙළෙඳසැල, මහජන පොළ, මුරකුටිය (පොළ), වැසිකිළිය (පොළ), දොරවෙල ගබඩාව, ආපන ශාලාව (පොළ) විදුලි බිල ගෙවීම. | 25 | 025759 | 17,184.05 |
| | ලංකා විදුලි බල මණ්ඩලය - 2020 අගෝස්තු මස කාර්යාලය, නගර සභා යාබද ගොඩනැගිල්ල, බැංකියවත්ත I, බැංකියවත්ත II, විදුලි බිල ගෙවීම. | 26 | 025759 | 43,443.25 |
| | Dialog Broadband Networks(Pvt) Ltd (pv 261) | 31 | 025763 | 18,805.05 |
| 2020.09.08 | සභාපති, සුබසරණ ජ්‍යෙෂ්ඨ පුරවැසි සංගමය - පුවක්ගහමුල්ල පාරේ මහේෂ් නිමන්ත මහතාගේ නිවසට යන මාර්ගය සංවර්ධනය කිරීම.- අවසන් ගෙවීම. | 32 | 025765 | 144,837.11 |
| 2020.09.10 | සුසාන භූමි භාරකරු දීමනා ගෙවීම | 41-1 | 025772 | 20,000.00 |
| | පෙරපාසල් දීමනා ගෙවීම. | 41-3 | 025772 | 40,000.00 |
| | පොලිතින් තේරීම සඳහා වැටුප් ගෙවීම 2020-08-01 දින සිට 2020-08-31 දක්වා | 41-5 | 025772 | 68,900.00 |
| | පොහොර හැලීම හා කසළ තේරීම සඳහා වැටුප් ගෙවීම 2020-08-01 දින සිට 2020-08-31 දක්වා | 41-6 | 025772 | 60,450.00 |
| | කසළ ඉවත් කිරීම සඳහා වැටුප් ගෙවීම 2020-08-01 දින සිට 2020-08-31 දක්වා | 41-7 | 025772 | 191,750.00 |
| | කර්මාන්ත අංශයේ දෛනික කම්කරු හා මේසන් වැටුප් ගෙවීම 2020-08-01 දින සිට 2020-08-31 දක්වා | 41-9 | 025772 | 184,800.00 |
| 2020.09.14 | බුලත්ගම එක්සත් මිතුරු සංසදය - දෙනියකුඹුර සුමිත් දයානන්ද මහතාගේ නිවස පාර ඉතිරි කොටස පැති බැම්ම සාදා මාර්ගය සංවර්ධනය කිරීම. | 45 | 025789 | 452,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 2020.09.15 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය - 2020 අගෝස්තු මස බස්නැවතුම්පල ජල බිල්පත ගෙවීම. | 49 | 025804 | 46,332.43 |
| | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය - 2020 අගෝස්තු හා සැප්තැම්බර් පොදු වෙළෙඳසැල, මහජන පොළ, බැංකියවත්ත ජල බිල ගෙවීම. | 50 | 025804 | 34,621.65 |
| | Dialog Broadband Networks(Pvt) Ltd | 53 | 025807 | 11,340.00 |
| | ලංකා විදුලි බල මණ්ඩලය - 2020 අගෝස්තු මස බස්නැවතුම්පල විදුලි බිල ගෙවීම. | 55 | 025808 | 33,116.58 |
| 2020.09.18 | එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම - බළන්ගොඩ නගරය පවිත්‍ර කිරීමට අදාළව හා පොදු වැසිකිළි ටෙන්ඩර් කිරීමට අදාළව සිංහල - දිනමිණ හා දෙමළ - තිනකරන් පුවත්පත්වල දැන්වීම් පළකිරීම වෙනුවෙන් ගෙවීම. | 87 | 025830 | 83,430.00 |
| 2020.09.21 | බී.කේ.ජේ.එස්.අමරදාස - 2020-08-01 දින සිට 2020-08-23 දක්වා ඉන්ධන බිල්පත් ගෙවීම. | 89 | 025832 | 127,716.78 |
| | බී.කේ.ජේ.එස්.අමරදාස - 2020-08-24 දින සිට 2020-08-30 ඉන්ධන බිල්පත් ගෙවීම. | 90 | 025832 | 54,650.21 |
| 2020.09.22 | සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය - 2020-06-07 දින සිට2020-06-29 දක්වා ඉන්ධන බිල්පත් ගෙවීම. | 93 | 025835 | 104,441.07 |
| | සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය - 2020-07-24 දින සිට 2020-07-31 දක්වා ඉන්ධන බිල්පත් ගෙවීම. | 94 | 025835 | 85,932.00 |
| | සී/ස ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය - 2020-07-27 දින සිට 2020-08-12 දක්වා ඉන්ධන බිල්පත් ගෙවීම. | 95 | 025835 | 153,368.20 |
| | එස්.ගොඩගේ සහ පුතුයෝ පුද්ගලික සමාගම - 2020 වර්ෂයට පුස්තකාලයට අවශ්‍ය පොත් මිළදී ගැනීම | 96 | 025836 | 103,788.50 |
| | එම්.ඩී.ගුණසේන සහ පුද්ගලික සමාගම - පුස්තකාලයට අවශ්‍ය පොත් මිළදී ගැනීම. | 97 | 025837 | 97,010.00 |
| | රෙජිස්ට්‍රාර් ජනරාල් - 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා හා 2020 ජනවාරි සිට මැයි දක්වා කාලයට අදාළ මුද්දර ගාස්තු උප ලේඛන සකස් කිරීමට කාර්ය මණ්ඩල දීමනාව. | 100 | 025840 | 16,600.00 |
| 2020.09.24 | ලංකා වෝල්ටයිල්ස් පී.එල්.සී. - බස්නැවතුම්පල වැසිකිළිය සඳහා ටයිල් ලබා ගැනීම. | 121 | 033552 | 51,775.00 |
| 2020.09.29 | පෝස්ට් මාස්ටර් ජනරාල් - තැපැල් මුද්‍රා යන්ත්‍රයට මුද්දර මුදල් රුපියල් දසදහසක් ඇතුළත් කිරීම. | 139 | 033587 | 10,000.00 |
| 2020.09.30 | සභාපති, එක්සත් සුභසාධක සමිතිය - ඇල්ලෙඅරාව එක්සත් මාවත මාර්ගයේ පැතිබැම්ම ඉදි කිරීමට අදාළව මුදල් ගෙවීම. | 155 | 033596 | 698,404.67 |
| | බළන්ගොඩ නගර වයම් එකමුතු ජෝෂ්ඨ පුරවැසි සංවිධානය - බළන්ගොඩ හැටන් නැෂනල් බැංකුව අසලින් දිවෙන මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම. | 156 | 033597 | 300,000.00 |
| 2020-10-02 | ඩබ්.අජිත ප්‍රියංකර සිල්වා - | 13 | 033610 | 24,600.00 |
| 2020-10-05 | වුඩ්ලන්ඩ් ටයර් සර්විස් -195X15 ප්‍රමාණයේ ටයර් 04 ක් ලබා ගැනීම. | 30 | 033620 | 93,975.00 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.41 බළන්ගොඩ නගර සභාවේ නිල වෙබ් අඩවියේ වාර්ෂිකව ගෙවන"Renewal for web Hosting Service" ගාස්තු ලෙස "Procons Infotech" ආයතනය සඳහා රු.10,800.00 ක මුදලක් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.42 RB -4786 ට්‍රැක්ටරය සඳහා 90 Amp බැටරියක් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම හා ඒ සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව Lucus 95Ah 2 Year බැටරියක් සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ චමින්ද බැටරි මාට් ආයතනයේ රු.19628.00 මිළ ගණන් අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.43 RC 1107 ට්‍රැක්ටරයේ බ්‍රේක් පද්ධතියේ පහත සඳහන් ද්‍රව්‍ය යොදා අලුත්වැඩියා කිරීම සඳහා තිළිණ මෝටර්ස් වෙතින් ඉදිරිපත් කර ඇති රු.28,000.00 ක මිළ ගණන අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| | | |
|---|---|---|
| Brake Actuating Assy | 02 | 23000.00 |
| Brake Disc | 04 | 5000.00 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.44 සභා ශාලාවේ වායු සමීකරණ යන්ත්‍රය අක්‍රියවීම හේතුවෙන් එය අළුත්වැඩියා කිරීම සඳහා Gemcity Traders ආයතනය සඳහා රු.13000.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05.01.45 බෝම්බුව ප්‍රජා ශාලාවේ ජල බිල්පත්වල හිඟ මුදල ගෙවා නැවත සම්බන්ධතාවය ලබා ගැනීමටත්, නගර සභාව සතු සියලු ජල සම්බන්ධතාවලට අදාළ පෙර සිට පැවත එන හිඟ මුදල් ගෙවීමටත් සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.46 පෙර පාසල් පාලිකාවක් වශයෙන් කේ. ශ්‍යාමා සිරිනි ශාන්ති මහත්මිය රු.15,000.00 ක දීමනාවක් මත සේවයේ යෙදවීමටත්, දැනට දීමනා මත සේවයේ යෙදෙන පෙර පාසල් පාලිකාවන්ගේ දීමනාව රු. 15,000.00 දක්වා වැඩි කිරීමටත් සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පෙර පාසල් පාලිකා ලෙස කේ.ශ්‍යාමා සිරිනි ශාන්ති මහත්මිය බඳවා ගැනීමට 2019-06-11 දිනැති මහ සභාවේ දී අනුමත වූ නමුත් සභා තීරණය ගෙන වසරකට අධික කාලයක් ගතව ඇතත් මෙම බඳවා ගැනීම මෙතෙක් සිදු නොවීම තුළ පෙර පාසල පවත්වාගෙන යාමට නොහැකි තත්ත්වයක් උද්ගතව ඇති බවත්, නගර සභා ප්‍රධාන පෙර පාසලේ ළමුන් ප්‍රමාණය 40 කට සීමා කිරීමට සිදුව ඇති බවත්, මෙය ප්‍රදේශයේ දරුවන්ට සිදු කරන අසාධාරණයක් බවත් අවධාරණය කරන ලදී. එමෙන්ම 2019 වසරේ ගනු ලැබූ තීරණය මෙතෙක් ඉටු නොවීම නිසා මෙමම යෝජනාව නැවත ඉදිරිපත් කිරීමට සිදු වූ බව ද කේ. ශ්‍යාමා සිරිනි ශාන්ති මහත්මිය රු. 15,000.00 ක මාසික දීමනාවක් මත පෙර පාසල් පාලිකාවක් වශයෙන් සේවය ලබා ගැනීම සුදුසු බව ද පවසන ලදී.

එමෙන්ම ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙමම පෙර පාසලේ වර්ෂ ගණනාවක් පුරා අඛණ්ඩව දරුවන් 60 ක් පමණ අධ්‍යාපනය ලබන බවත්, 2021 වර්ෂය සඳහා ද අයදුම්පත්‍ර 60 කට අධික සංඛ්‍යාවක් ලැබී ඇති බවත් ය. එමෙන්ම දරුවන් 60 දෙනෙකු සඳහා අධ්‍යාපනය ලබා දීමට ප්‍රමාණවත් භෞතික සම්පත් තිබිය දීත් පෙර පාසල් පාලිකාවකගේ පුරප්පාඩුව මත බඳවා ගන්නා ලද දරුවන් සංඛ්‍යාව අඩු කිරීම බළන්ගොඩ ජනතාවට කරන අසාධාරණයක් බව ද සභාවේ ප්‍රධානතම පෙර පාසල අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා තාවකාලිකව මාසික දීමනා ගෙවීමේ පදනම මත පෙර පාසල් පාලිකාවකගේ සේවය ලබා ගැනීම මෙමම අවස්ථාවේ අත්‍යවශ්‍ය බව ද ගරු සභාපතිතුමා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

මීට අමතරව බළන්ගොඩ නගර සභාව මඟින් පාලනය වන බෝම්බුව හා වැවවත්ත පෙර පාසල් දෙකෙහි පෙර පාසල් පාලිකාවන් 04 දෙනෙකු රු.10,000.00 ක දීමනාව මත සේවය කරන අතර, ඔවුන් වර්ෂ ගණනාවක සිට තම සේවය ඉතා හොඳින්

දරුවන්ට දෙනු ලබන බවත්, රු. 6,000.00 ක පැවති දීමනාව 2014 වර්ෂයේ රු. 10,000.00 දීමනාව දක්වා වැඩි කිරීමෙන් පසුව මේ වන තෙක් දීමනාවෙහි වැඩි වීමක් සිදු නොකල බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

එබැවින් පෙර පාසල් දීමනාව රු. 15,000.00 දක්වා වැඩි කිරීම සඳහා වූ යෝජනාව 2019-02-12 දින පැවති මහා සභාව වෙත ඉදිරිපත් කළ අතර, එය 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීම සුදුසු බවට අනුමත වූ නමුත් තවමත් මේ සම්බන්ධව අනුමැතිය ලබා දී නොමැති බව ද මේ නිසා මෙම පෙර පාසල් පාලිකාවන්ගේ දීමනාව රු. 15,000.00 දක්වා වැඩි කිරීම සඳහා අවශ්‍ය අනුමැතියට නැවත ඉදිරිපත් කිරීම සුදුසු බව ද සඳහන් කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.47 HF 7899 JCB යන්ත්‍රයට පහත සඳහන් අමතර කොටස් ලබා ගැනීම සඳහා ආසිරි කන්ස්ට්‍රක්ෂන් වෙතින් ඉදිරිපත් කර ඇති රු.19,800.00 ක මිළ ගණන් අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ලබා ගැනීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05.01.48 2020 වර්ෂයේ වැසිකිළි ආධාර ලබා දීම සඳහා අනුමැතියට ඉදිරිපත් කළ නාමලේඛනයේ නො.36, පරගහකුඹුර, බෝම්බුව, බළන්ගොඩ යන ලිපිනයේ පදිංචි බී.ජී. කරුණාරත්න යන අයගේ නම බී.ජී.කරුණාසේන ලෙස නිවැරදි කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

## 06.මන්ත්‍රී යෝජනා

### 006.01 ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය

06.01.01 එගොඩ හුණුකුඹුර සිට කෝපිවත්ත මාර්ගය දක්වා දිවෙන අතුරු මාර්ගයේ ජලතල එළිම සඳහා මාර්ග උරහිස පලුදු කිරීමේ ගාස්තුවෙන් නිදහස් කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය එගොඩ හුණුකුඹුර සිට කෝපිවත්ත මාර්ගය දක්වා දිවෙන අතුරු මාර්ගයේ කුඩා ප්‍රමාණයක් පමණක් සකස් කර ඇති අතර මාර්ගයේ ඉතිරි ප්‍රමාණය සංවර්ධනය කර නොමැති බවත්

ඉදිරියේදී එම කොටස සංවර්ධනය කිරීමට නියමිත බවත් පවසන ලදී. එබැවින් මෙම මාර්ගයේ ජලනල එලීම සඳහා මාර්ග උරහිස පලුදු කිරීමේ ගාස්තුවෙන් නිදහස් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.02 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා

06.02.01 නගර සභාව සතු කොඩිලස් කැමරා දැනට පාවිච්චි කරන්නේද? එසේනම් කොහෙනද? වර්තමානයේ බස්නැවතුම්පලේ උද්ගත වී ඇති තත්ත්වය අනුව පඩිපෙළවල් අසළ සවි කොට උඩු මහලේ බෝඩ් කිහිපයක් ස්ථාපිත කරන්න. එහි මෙම ස්ථානයේ CCTV කැමරා ක්‍රියාත්මකයි කියා දැන්වීම් කරන්න.

06.02:02 නගරයේ ඉතාම දරුණු ප්‍රශ්නයක්, බළන්ගොඩ මූලික රෝහලේ දැවෙන ප්‍රශ්නයක්, අයාලේ යන බල්ලන්ට ගත හැකි පියවර, ඉදිරියේදී හෝ බෝ වීම වැලැක්වීමට ක්‍රියා කිරීම, ඇත්තටම අයාලේ යනා බල්ලන්ගේ ප්‍රශ්නය අයිති නගර සභාවටද? මහජන සෞඛ්‍ය පරීක්ෂක කාර්යාලයටද? නැත්නම් කොයි ආයතනයටද? නගරයේ යන බල්ලන්ට නැවතත් ජලභීතිකා එන්නත් ලබා දීමට කටයුතු කිරීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිනිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් නගරයේ සෑම තැනම සුනඛයින් සිටින බවද විශේෂයෙන් බළන්ගොඩ මූලික රෝහලේ වෛද්‍ය අධිකාරිතුමියගේ ඉල්ලීමක් මේ සම්බන්ධව පවතින බව ද සුනඛ වන්ධ්‍යාකරණ වැඩ සටහනක් නැවත ක්‍රියාත්මක කරන ලෙස ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී විමලසිරි මැතිතුමා අදහස දක්වමින් මෙම සුනඛ ගැටලුව නිසා මහජනතාව නගර සභාවට චෝදනා කරන බැවින් මේ සඳහා පිළියමක් යොදන ලෙස පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බස්නැවතුම්පල සඳහා පොලිස් මුරකුටියක් සකස් කර දුන් නමුත් එහි රාජකාරි කිරීමට නිලධාරියෙක් නොමැති බව පොලිසිය විසින් පැවසූ බවද නගර සභාව මඟින් නිලධාරියෙකු බස්නැවතුම්පල අධීක්ෂණය සඳහා යොදවා ඇති බව ද පවසන ලදී. සුනඛ ගැටලුව විසඳීම සඳහා අවශ්‍ය ආම්පන්න ,පුහුණු නිලධාරීන් නොමැති බැවින් සෞඛ්‍ය නිලධාරි කාර්යාලය හා සම්බන්ධ වී කටයුතු කරන බව ද මේ දිනවල කොවිඩ් 19 හා සම්බන්ධ වී මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් කටයුතු කරන බැවින් ඔවුන් මේ දිනවල යොදවා ගැනීමේ හැකියාවක් තිබේදැයි විමසිය යුතු බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.03 ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා

06.03.01 කල්තොට පාරේ දෙහිගස්තලාව හා ගොරොක්ගහමඩ පාරේ කාණුව නිසි පරිදි සකස් කර නොමැත. මේ පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා වර්ෂා කාලයේදී වර්ෂා ජලය මාර්ගයෙන් ගලා යන බව ද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ජේසීබී යන්ත්‍රයක් යොදා කාණුවක් කැපුවද එය නිසි පරිදි සිදු කර නොමැති බව ද මෙය විධිමත් පරිදි සකස් කරන ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන ලෙස ද පවසන ලදී.

එමෙන්ම බලන්ගොඩ රජයේ කාර්යාල අවසන් වන වේලාවට අවශ්‍ය ස්ථානවලට රථවාහන පොලිසියේ නිළධාරීන් යොදවන ලෙස පොලිසිය වෙත දැනුම්දෙන ලෙස පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.04 ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය

06.04.01 බිංදු මහතාගේ නිවස අසළ මාර්ගය සංවර්ධනය කිරීම යන යෝජනාව බිංදු මහතාගේ නිවස අසළ කාණුව සංවර්ධනය කිරීම යනුවෙන් කර්මාන්තයේ නම සංශෝධනය කිරීම.

06.04.02 ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වාර්තාව යම්කිසි ස්ථානයකට ලබාගැනීමෙන් අනතුරුව එම වාර්තාව වලංගු කාලසීමාව තුළදීම වෙනත් පුද්ගලයෙකුට එම ඉඩම් කොටස පැවරූ පසු නගර සභාව මඟින් ලබා ගන්නා ලද සේවාවන්වලදී නැවත වතාවක් ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වාර්තාව ඉල්ලා සිටී. එසේ නැවත වාර්තාවක් ලබා නොගෙන පෙර ලබාගත් වාර්තාවෙන් එම සේවාවන් ලබාදෙන ලෙස යෝජනා කරමි.

06.04.03 ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ ප්‍රාදේශීය කාර්යාලයක් හෝ සතියකට එක් දිනක් සේවාවන් ලබාදීමට බලන්ගොඩ ප්‍රාදේශීය කාර්යාලයක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යම් කිසි පුද්ගලයෙකු විසින් ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වාර්තාව ලබා ගැනීමෙන් පසු මාස 06 ක් යන තෙක් එය වලංගු වන බැවින් එම ඉඩම වෙනත් පුද්ගලයෙකුට අදාල කාලසීමාව තුළදීම විකුණුවහොත් නැවත වරක් ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වාර්තාව ලබා නොගෙන පෙර වාර්තාවෙන්ම අවශ්‍ය සේවාව ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන ලෙස පවසන ලදී.

එමෙන්ම ගොඩනැගිලි පර්යේෂණ ආයතනය රත්නපුර ප්‍රදේශයේ පිහිටා ඇති බැවින් බලන්ගොඩ ප්‍රදේශයේ ජනතාවට රත්නපුර යාමට සිදු වන අතර, බලන්ගොඩ ප්‍රදේශයේ එහි ශාඛාවක් පිහිටුවන ලෙස හෝ එසේ නොමැතිනම් සතියකට එක් දිනක් එම සේවාව බලන්ගොඩ ස්ථානයක ,දී ලබාදෙන ලෙසට යෝජනාවක් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව

වෙත ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී. එමෙන්ම බොහෝ දෙනාට දැනට පවතින ස්ථානය සොයා ගැනීමට අපහසු බවද එකම කාර්යය සඳහා පුද්ගලයින් දසදෙනෙකු පමණ බළන්ගොඩ සිට රත්නපුරට යන බැවින් ඒ සඳහා කාර්යාලයක් ඉල්ලා සිටින බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06.05 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

06.05.01 බළන්ගොඩ නගර සභාවට අයත් වැවේවත්ත ප්‍රජා ශාලා භූමියේ පිටුපස බිම් කොටසක් පිටස්තර අයෙකු විසින් කොටුකර එළවලු වගා කර ඇත. එම බිම් කොටස නගර සභාවට පවරාගෙන වැවවත්ත උද්‍යානයේ පදිංචිකරුවන්ගේ සුභසාධක සංගමය වන වැවවත්ත ප්‍රජා එකමුතුවේ උත්සව භාණ්ඩ තැබීම සඳහා තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ලබාදීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා මෙම ඉඩම් කොටස නගර සභාව වෙත පවරා ගෙන වැවවත්ත සුභසාධක සංගමය වෙත තාවකාලික ගොඩනැගිල්ලක් සඳහා ලබා දෙන ලෙස පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06.06 ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

06.06.01 තම ඉතිරිව ඇති මන්ත්‍රී ප්‍රතිපාදන මඟින් ඕලුගංතොට ගොවි සංවිධානය සඳහා පහත සඳහන් උපකරණ ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- ✓ සාස්පාන් කට්ටලයක්
- ✓ ගෑස් ලිප
- ✓ ගෑස් සිලින්ඩරය
- ✓ රෙගියුලේටරය
- ✓ පුටු

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

## 07.කර්මාන්ත කමිටුව මඟින් නිර්දේශ කරන ලද යෝජනා

### 07.01 ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය

07.01.01 යසවතී හෙට්ටිආරච්චි මහත්මියගේ නිවෙස්වලට යන මාර්ගය සංවර්ධනය කිරීමේ යෝජනාව කළුවැල්ල කැලේ මාර්ගය සංවර්ධනය කිරීම සහ කාණු පද්ධතිය සකස් කිරීම ලෙස කර්මාන්තයේ නම සංශෝධනය කිරීම

07.01.02 බිංදු මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගය සහ කාණුව ඉතිරි කොටස සංවර්ධනය කිරීම. - (මන්ත්‍රී යෝජනා මත සභා අරමුදලින් සිදුකරන සංවර්ධන කටයුතු)

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය සභාව ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී පුනේත්‍රා වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

### 07.02 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා

07.02.01 පැරණි ගම්සභා මාර්ගයක් වන පල්ලෙවෙල බැංකියවත්ත යා කෙරෙන පඩිපෙළ ඉවත් කර ජේසීබී යන්ත්‍රය යොදා අළුතින් මාර්ගයක් කැපීම.-

වැඩ අධිකාරී මහතාගේ නිරීක්ෂණයෙන් පසු සිදු කළ හැකිද නොහැකිද යන්න තීරණයක් ගැනීම සුදුසු බව තීරණය විය.

07.02.02 තානායම්ගෙදරවත්ත පාර කාණු ගොඩ දමා මාර්ගය පෙර නිමි තාර යොදා අළුත්වැඩියා කිරීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

### 07.03 ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා

07.03.01 ගල්වල උඩකන්ද මාර්ගය ආරම්භක ස්ථානයේ සිට අළුත්වැඩියාව.

07.03.02 වතුකාරගොඩ ගංවතුරට කඩා ගිය කොටස ඉදිකිරීම.

07.03.03 පරගහකුඹුර මාර්ගය කැඩී බිඳී ගිය තැන් අළුත්වැඩියාව,

07.03.04 බලංගොඩ පෙට්ටිගල මාර්ගය දෙපස කැලේ වැවී ඇති බැවින් පළාත් ඉංජිනේරු කාර්යාලයට දැනුම්දීම.

07.03.05 බලංගොඩ බස් නැවතුම්පොළ ගුවන් පාලම අභියස වැසි ජලය බැසීමට ඇති දුන්නක අඩුවක් පවතී. එය සකසා ගැනීම.

07.03.06 බලංගොඩ බෝම්බුව නිල්වලා ක්‍රීඩා පිටිය අසල ඇති මාර්ගයේ ඉන්ටර්ලොකින් ගල් ගිලා බැසීම හේතුවෙන් එය සකසා ගැනීම.

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ගල්වල උඩකන්ද මාර්ගය 300m ප්‍රමාණයක තාර දමා ඇති කොටස අලුත්වැඩියා කරන ලෙසත් වතුකාරගොඩ ගංවතුරට කඩා ගෙන ගිය කොටස අලුත්වැඩියා කරන ලෙසත් තමන් තුන්වන වරට සභාවට ඉදිරිපත් කළ බව ද මහජනතාව මෙවැනි හදිසි අවස්ථාවකදී පිහිටවෙතැයි සභාවෙන් බලාපොරොත්තු වන බව ද පැවසීය. එමෙන්ම පරගහකුඹුර මාර්ගයේ ඉතා කුඩා නඩත්තුවක් පමණක් තිබෙන බැවින් එය සකස් කරන ලෙසද බලංගොඩ පෙට්ටිගල මාර්ගය දෙපස කැලේ වැවී ඇති බැවින් පළාත් ඉංජිනේරු කාර්යාලයට දැනුම් දෙන ලෙස ද බලංගොඩ බෝම්බුව නිල්වලා ක්‍රීඩා පිටිය අසල ඇති මාර්ගයේ ඉන්ටර්ලොග් ගල් ගිලා බැස ඇති අතර එය යථා තත්ත්වයට පත් කරන ලෙස ද පවසන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

07.04 ගරු නාගරික මන්ත්‍රීනි ජී.චන්ද්‍රලතා මැතිතුමිය

07.04.01 හුණුකුඹුර කෝපිවත්ත මාර්ගයේ අංක.290 පදිංචි එස්.පී.පියසීලි මහත්මියගේ නිවසට පඩික වර්ෂාවෙන් ආරක්ෂිත බැම්ම කඩා වැටී ඇත. එබැවින් මාර්ගයට දැඩි අවධානමක් පවතින අතර,නිවසද ඉරිතලා ගොස් ඇති හෙයින් ජීවිත අවදානමද ඇති නිසා බැම්ම ඉදිකිරීමේ මූලික අත්තිවාරමට අවශ්‍ය ද්‍රව්‍ය සපයා දෙන ලෙස ඉල්ලීම.

07.04.02 ආනන්ද මෛත්‍රී මාවත මාර්ගය දෙපස වැසී වල් බිහි වී ඇත. මේ නිසා මෙම මාර්ගයේ කාණු පද්ධතිය වැසී ඇති අතර ජේසීබී යන්ත්‍රය යොදා සුද්ධ කර දෙන ලෙස ඉල්ලීම.

07.04.03 ආනන්ද මෛත්‍රී මාවත මාර්ගයේ සුදර්ශනගමට පිවිසෙන අතුරු මාර්ගය සුදර්ශනගම යනුවෙන් නාම පුවරුවක් නොමැති බැවින් ගම්වාසීන්ගේ ඉල්ලීම පරිදි සකස් කර දීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

හුණුකුඹුර කෝපිවත්ත මාර්ගයේ අංක.290 පදිංචි එස්.පී.පියසීලි මහත්මියගේ නිවසෙහි ඉදි කර ඇති වසර දෙකක් පමණ වන බැම්ම වර්ෂාව හේතුවෙන් කඩා වැටී ඇති නමුත් ඇයට කිසිඳු රජයේ ආයතනයකින් සහනයක් ලැබී නොමැති බව ද අත්තිවාරම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හෝ ලබා දෙන ලෙස පැවසූ ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා, ආනන්ද මෛත්‍රී මාවත ශුද්ධ කර දෙන ලෙසත් ආනන්ද මෛත්‍රී මාවතෙන් සුදර්ශනගමට පිවිසෙන මාර්ගය තුල සුදර්ශනගම නාම පුවරුව සවි කරන ලෙසත් පවසන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

07.05 ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.ජේමදාස මැතිතුමා

07.05.01 දුනුමඩලගහවත්ත මාර්ගයේ චින්තක මහතාගේ නිවස අසල සිට ගුණපාල මහතාගේ නිවස දක්වා ඇති මාර්ගයේ පළුදු වී ඇති තැන් පිළිසකර කිරීම.

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.ජේමදාස මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

07.06 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා

07.06.01 සිරි වීරසුන්දරාරාම මාවතට හැරෙන පල්ලිය ළඟ හංදියේ පදිකයින් වැටෙන කාණුව ආවරණය වන සේ කොන්ක්‍රීට් තහඩු දෙකක් දැමීම.

07.06.02 ප්‍රධාන වීදියේ සිට බස් නැවතුම්පොළ පාරට හැරෙන බුහාරි හෝටලය අසල පදික වේදිකාව, ප්‍රධාන වීදිය හා බස්නැවතුම් මාර්ගය එක මට්ටමකට ගෙන පදිකයන්ට පහසුවෙන් යාමට හැකිවන සේ සංවර්ධනය කිරීම.

07.06.03 ප්‍රධාන වීදියෙන් නානායම් පිවිසුම් පාරට හැරෙන මැණික් වෙළෙඳාම්කරුවන් සිටින හංදියේ කොන්ක්‍රීට් තහඩු ඇත් වී ඇත. පදිකයින්ට සහ මැණික් ව්‍යාපාරිකයින්ට මහත් හිසරදයක් වී ඇති එම ස්ථානය පිළිසකර කර දීම.

07.06.04 සේනක පෙදෙසේ මාර්ගයට පස් වැටෙන ස්ථානයේ අඩි 02ක් උස අඩි 30ක් දිග බැම්මක් ඉදිකරදීමට කටයුතු කිරීම.

07.06.05 ලංකා බැංකු මාවත බස් නැවතුම්පොළට යා කරන්න.

07.06.06 දේශබන්දු මහතාගේ (නිල තොලත් මහේස්ත්‍රාත්) නිවෙස්වලට හැරෙන මාර්ගය හංදියේ පදිකයින් වැටෙන වලක් ඇති නිසා එම වංගුව අසල කොන්ක්‍රීට් තහඩු දෙකක් දමා කාණුව ආවරණය කරදීම.

07.06.07.කරච්කැටිය වටරවුම් පාරේ සී.සී විද්‍යාලය දක්වා කාණුව එක පැත්තක් ආවරණය කර පාසල් ළමුන්ට ඇති අනතුරුදායක තත්වය මගහරවා දීමට කටයුතු කිරීම.

07.06.08 සිරි වීරසුන්දරාරාම මාවත ආරම්භයේ ප්‍රධාන තැපැල් කාර්යාලය ඉදිරිපිට මාර්ගය සහ ඊ.එල් කඩය අතර තීරුව තාර දමා සංවර්ධනය කර දීම.

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් තමන් විසින් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් යෝජනා සියල්ල ඉටු කරන ලෙස පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07.07 ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය

07.07.01 කොටුගොඩැල්ල කාණු පද්ධතිය සකස් කිරීම

07.07.02 යූ.කේ .ෆයර් යෞවන සමාජයට කැනපි හට් 01ක්, පුටු 50ක්, බුගේ සෙට් 01ක් ලබාදීම

07.07.03 වතුකාරගොඩ වෙල කොටසේ ඉතිරි වී ඇති පැතිබැම්ම ඉදිකිරීම.

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කොටුගොඩැල්ල කාණු පද්ධතියෙහි 100 m ක පමණ කොටසක් සකස් කිරීමට ඇති අතර එය සකස් කරන ලෙසද තමන්ගේ වතුකාරගොඩ වෙල කොටසේ ඉතිරි වී ඇති පැතිබැම්ම ඉදිකිරීම තම

මන්ත්‍රී ප්‍රතිපාදන වල ඉතිරි කොටසින් සිදු කරන බව ද කියවීම් ශාලාව ඉදිරිපිට පාර සකස් කිරීම සම්බන්ධව පසුගිය කර්මාන්ත කමිටුවේදී සාකච්ඡා කළ අතර එය සකස් කරන ලෙසද නුවන් විසින් ඉදිකල බැම්ම මාර්ගයට ඇල වී ඇති බවද පවසන ලදී.

විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

08. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 10,043,696.14 |
| වෙනත් ලැබීම් | 2,760,966.15 |
| මුලු ලැබීම් | 12,804,662.29 |
| පුනරාවර්තන වියදම් | 12,199,269.10 |
| වෙනත් වියදම් | 2,867,016.23 |
| මුලු වියදම් | 15,066,285.33 |

2020-09-01 සිට 2020-09-30 දක්වා ඉන්ධන වාර්තාව

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 56-1906 | 24,440.00 |
| 227-5020 | 54,640.00 |
| | 425.85 |
| RD - 8240 | 23,680.00 |
| BC-0005 | 42,970.00 |
| GC 0001 | 5,905.85 |
| 226-7521 | 12,480.00 |
| RC 8183 | 28,600.00 |
| LL - 7688 | 2,704.00 |
| HF - 8558 | 17,585.86 |
| GK-6227 | 13,331.70 |
| JD-4684 | 2,740.00 |
| ZA 0028 | 5,200.00 |
| ND-5124 | 28,267.20 |
| PF-4006 | 29,040.00 |
| QL-2901 | 3,288.00 |
| 37-7933 | 10,296.00 |
| RC-1107 | 27,891.72 |
| LL-2110 | 22,517.00 |
| RC 1118 | 28,080.00 |
| OV/M 0017 | 4,708.00 |
| UQ - 1933 | 2,740.00 |

| | |
|---|---|
| CSM 009 | 411.00 |
| CwM | 548.00 |
| MG 0014 | 20,800.00 |
| ZA 5039 | 71,482.00 |
| | 14,795.04 |
| | 5,500.00 |
| YG-0758 | 2,055.00 |
| එකතුව | **507,122.22** |

**විරෝධතා නොවූ හෙයින් ආදායම් වියදම් වාර්තාව හා ඉන්ධන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**09. ඇස්තමේන්තු අනුමත කිරීම.**

09.01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා

09.01.01 කරවකැටිය ගල්වල පාර පැති කාණුව ඉදිකිරීම - රු.510,655.12

ඉහත සඳහන් ඇස්තමේන්තුව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත ඇස්තමේන්තුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

09.02 ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා

භාර විය.

09.02.01 අනඳමෙත්ගම ප්‍රජාශාලාවේ වැසිකිලිය අලුත්වැඩියා කිරීම. - රු.128000.00

ඉහත සඳහන් ඇස්තමේන්තුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත ඇස්තමේන්තුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**10. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම**

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා**

බලන්ගොඩ නගර සභාවේ හිටපු මහජන සෞඛ්‍ය පරීක්ෂක නිමල් ප්‍රේමතිලක මහතා විසින් බලන්ගොඩ පිළිබඳ තොරතුරු සියලුම දෙනාටම දැන ගනු පිණිස පොතක් මුද්‍රණය කරමින් බලන්ගොඩ නගර සභාවට ලබා දුන් කීර්තිය පිළිබඳ තම සතුට ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම බලන්ගොඩ නගර සභාව මෙතරම් දුර සාර්ථකව ගෙන ඒම සඳහා නගර සභා නිළධාරීන්ගේ කැපවීම හා මහන්සිය ඉවහල් වූ බව ද සභාපතිතුමා නියෝග නිකුත් කිරීම සිදු කරනු ලබන අතර නිළධාරීන් විසින් බොහෝ වැඩ කොටසක් ඉටු කරනු ලබන බවද එනිසා නිළධාරීන්ට මුල් තැන දුන් බව ද එක් දිනක දී මෝටර් ග්‍රේඩරය සම්බන්ධව සභාවේදී කථා කළ අතර මෝටර් ග්‍රේඩරය ලබා ගත්

අය විසින් මුදල් නොගෙවූ නිසා නිලධාරීන්ට එම මුදල ගෙවීමට සිදු වූ බව ද නිලධාරීන් විසින් ලබා [illegible] නිලධාරීන්ට සිදුවූ එම අසාධාරණය පිළිබඳ තමන්ගේ කණගාටුව ප්‍රකාශ කරන බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.ජේමදාස මැතිතුමා

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.ජේමදාස මැතිතුමා අදහස් දක්වමින් කම්කරු විනිශ්චය සභා ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සඳහා යැයි පවසමින් ඇතැම් නඩු විභාග වෙමින් පැවති අවස්ථාවක කම්කරු විනිශ්චය සභාව රත්නපුරට ගෙන ගිය අතර, එම ගොඩනැගිල්ල අලුත්වැඩියා කර වසරක පමණ කාලයක් ගතව ඇතත් මේ වන තෙක් එම කාර්යාලය බළන්ගොඩට ගෙනවිත් නොමැති බැවින් එය සම්බන්ධීකරණ කමිටුවට හෝ යොමු කරන ලෙස පවසන ලදී.

එමෙන්ම මහමෙව්නා මාවතේ නොදිරන කසළ එකතු කිරීම සඳහා ට්‍රැක්ටර් රථය ගමන් නොකරන බව ප්‍රදේශවාසීන් ප්‍රකාශ කළ අතර ඒ සඳහා නිශ්චිත දවසක් යොදවන ලෙස ද ඉඩ් සිටි අසළ ඇති වීථි පහන් බොහෝ දිනක සිට දල් නොවෙන බැවින් එය සකස් කරන ලෙස ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී කේ. ජී, ජේමදාස මැතිතුමා, වැසිකිළි ආධාර ලබා දීමේ වර්තමාන ප්‍රගතිය කෙසේ දැයි ද විමසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා නොදිරන කසළ එකතු කිරීම සඳහා නිශ්චිත දවසක් පවතින බවත්, ඒ සම්බන්ධව මහජනතාව බොහෝ අවස්ථාවලදී දැනුවත් කර ඇති බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ යනු සුවිශේෂී නගරයක් වන අතර කෙසේ හෝ කොවිඩ් 19 වෛරසය මැඩපැවැත්වීම කළ යුතු බව ද කම්කරු විනිශ්චය සභා ගොඩනැගිල්ලෙහි අලුත්වැඩියාව අවසන් කර වසරක පමණ කාලයක් ගතව ඇති බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා කුකුල් මස් කඩ පිළිබඳ ගන්නා තීරණය පිළිබඳව ද බුදු පිළිමය ඉදිරිපිට ඇති කඩ කාමර දෙක ඉවත් කරන ලෙසට නගර සභාවෙන් දැනුම් දී ඇති අතර එම කඩ කාමර හිමියන්ට වෙනත් කඩ කාමර ලබා දෙන්නේ ද? බළන්ගොඩ නගරයේ ඇති ඉතිරි කඩ කාමර පිළිබඳ ගන්නා තීරණය කුමක්ද? යන්නත් විමසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා බුදු පිළිමය ඉදිරිපිට ඇති කඩ කාමර දෙක දෙසැම්බර් මාසයේ ඉවත් කර ගත යුතු බවද, ඉතිරි කඩ මාර්ගයට නොපෙනෙන සේ පවත්වා ගත යුතු බව ද අලුතින් කඩ කාමර ආරම්භ කිරීමට අවස්ථාව ලබා නොදෙන ලෙස ද පවසන ලදී.

නැවත අදහස් දක්වන ලද ගරු මන්ත්‍රීතුමා නගර සභා ක්‍රීඩාංගණයෙහි කාණුව පිරී ඇති බැවින් වටපිටාව ශුද්ධ පවිත්‍ර කරන ලෙස පැවසූ අතර, ක්‍රීඩාංගණයෙහි විදුලි බල්බ නොමැති ස්ථානවල බල්බ් දැම්මේ දැයි විමසන ලදී. එමෙන්ම බෝම්බුව දෙවට පාරට හැරෙන ස්ථානයෙහි පාලම පළල් කිරීම සඳහා පළාත් මාර්ග කාර්යාලය දැනුවත් කරන ලෙසත්, මුස්ලිම් සුසාන භූමියේ සිට කහට පිටිය මාර්ගය දක්වා වීථි පහන් අක්‍රිය බැවින් එය සකස් කරන ලෙසද පැවසීය.ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් බුදු පිළිමය ඉදිරිපිට පවතින කඩ කාමර ඉවත් කිරීම සිදු කිරීම සුදුසු වන නමුත් එම කඩහිමියන් ඉදිරියට තවදුරටත් මාස තුනක් ලබා දෙන ලෙස ඉල්ලීමක් සිදු කරන බව ද එම කඩ හිමියන් වසර 15 ක පමණ කාලයක් වෙළෙඳාම් සිදු කළ අය නිසා ඔවුන්ට වෙනත් ස්ථානයක හෝ කඩ කාමර ලබා දෙන ලෙස ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය

මෙහි දී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය වැසිකිළි ආධාර ලබා දීමේ වර්තමාන ප්‍රගතිය කුමක්දැයි විමසන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය

ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් මාර්ග ශුද්ධ පවිත්‍ර කිරීමේ කටයුතු සඳහා ශ්‍රමිකයන් වැඩි පිරිසක් යෙදවීම මඟින් ඉතාමත් අල්ප සේවාවක් ඔවුනගෙන් සිදුවන බව ද ඇතැම් විට ශ්‍රමිකයින් අනවශ්‍ය ලෙස කර්මාන්ත සඳහා යොදවන බවට මහජනතාවගෙන් පැමිණිලි ලැබෙන බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය, මේ නිසා අධීක්ෂණ කටයුතු සඳහා කවුරුන් හෝ යොදවන ලෙස ද අනවශ්‍ය පරිදි එම ස්ථානවල ට්‍රැක්ටර් රථ හා රියදුරු මහත්තුරුන් කාලය ගත කරන බව ද පවසන ලදී. එමෙන්ම සමනල මුදලාලිගේ නිවස ඉදිරිපිට කාණුව පිළිසකර කර දෙන ලෙස ද කුඹගොඩ ත්‍රීවීල් සංගමය සඳහා පොදු වැසිකිළියක් සකස් කර දෙන ලෙස ඉල්ලීමක් සිදු කරන බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා

ප්‍රාර්ථනා බෝධිය වැඳපුදා ගැනීම සඳහා බොහෝ බැතිමතුන් ප්‍රමාණයක් පැමිණෙන අතර ඔවුන් විසින් ගෙන එන මල් වර්ග ආදි අපද්‍රව්‍ය බොහෝ ප්‍රමාණයක් එම ස්ථානයේ එක්රැස් වන බැවින් එම අපද්‍රව්‍ය ප්‍රාර්ථනා බෝධිය අසළට ගොස් ලබා ගැනීමට කටයුතු කරන ලෙස ද එම අපද්‍රව්‍ය මාර්ගය අසළට ගෙන ඒමට නොහැකි බැවින් ප්‍රාර්ථනා බෝධියට ගොස් ගැනීමට කටයුතු කරන ලෙස ද පවසන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා

ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ ඇති මාර්ග කාපට් මාර්ග ලෙස සංවර්ධනය වෙමින් පවතින අතර එහිදී ජල සම්පාදන මණ්ඩලය, විදුලි අධිකාරි, මාර්ග සංවර්ධන අධිකාරිය හා නගර සභාව සමඟ එක් වී කටයුතු කළ යුතු බව ද එසේ නොමැති වුවහොත් ජල සම්පාදන මණ්ඩලය විසින් ජල නල එළීම සඳහා මාර්ග කාපට් කිරීමෙන් පසුව පළුදු කරන බව ද සඳහන් කළ ගරු උප සභාපතිතුමා, මේ නිසා මාර්ගයක් කාපට් කිරීමට පෙර අදාළ ආයතන එක් වී සාකච්ඡා කළ යුතු බව ද නැතහොත් එහි චෝදනාව ගරු සභාපතිතුමාට එල්ල වන බව ද පවසන ලදී.

එමෙන්ම කොරෝනා සම්බන්ධව අවදානමක් පවතින බැවින් ඒ පිළිබඳව ගත යුතු අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතු බවද මෙවැනි අවදානම් මොහොතක සභාවේ ගරු සභාපතිතුමා, ලේකම්තුමිය ඇතුළු නිලධාරීන් එහි වගකීම ගෙන කටයුතු කිරීම පිළිබඳ තම ස්තූතිය පුද කරන බව ද ගරු උප සභාපතිතුමා පැවසීය.

මීට අමතරව මන්ත්‍රී යෝජනා ලබාගත් පසු එය කළ යුතු ක්‍රමය හඳුනාගෙන එම යෝජනාව සභාවට ඉදිරිපත් කළ යුතු අතර එසේ නොමැතිව සෑම යෝජනාවක්ම සභාවට ඉදිරිපත් කර සභාපතිතුමාගේ වැරද්ද නොකිය යුතු බව ද අවශ්‍ය යෝජනා පමණක් සභාවට ඉදිරිපත් කළ යුතු බව ද පවසන ලදී.

එමෙන්ම කල්තොට පාරේ, වෛද්‍ය නූර්දීන් රිෆායිදීන් මහතාගේ නිවස ඉදිරිපිට කොන්ක්‍රීට් ස්ලැබ් නොමැති බැවින් ඒ පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන ලෙස පැවසූ අතර, හිටපු මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා විසින් රචනා කළ ග්‍රන්ථය පිළිබඳ බොහෝ සතුටු වන බවත් මෙය බළන්ගොඩට ආඩම්බරයක් බවත් මන්ත්‍රීවරුන්ට ලක්ෂ 8ක් වෙන් කර ඇති අතර මීළඟ කර්මාන්ත කම්ටුවට ගරු මන්ත්‍රීවරුන් වියදම් කළ මුදල හා ඉතිරි මුදල ඉදිරිපත් කරන ලෙසත් පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින් සභාව පැවැත්වීමේ දී කාලය කළමනාකරණය කර ගත යුතු නමුත් න්‍යාය පත්‍රය දිගු නිසා කාලය වැය වන බව ද පසුගිය සභාවේ න්‍යාය පත්‍රය තුල යෝජනා 59 ක් තිබුණ අතර මෙවර 41 ක් පවතින බව ද මෙලෙස යෝජනා ලබා දීමෙන් සභාපතිතුමාට මෙය සිදුකිරීමට ප්‍රායෝගිකව අපහසු බව ද පරිණත මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් මේ බව දන්නා නිසා ඔවුන් යෝජනා ලබා නොදෙන බව ද සඳහන් කළේය. මීට අමතරව ඇතැම් මන්ත්‍රීවරුන් අයවැය සඳහා ලබා දෙන යෝජනා නොමැති වුවත් මාසිකව යම් යම් යෝජනා ලබා දෙන බව ද මේ නිසා වැඩ අධිකාරි මහතාට බොහෝ වගකීම් පැවරෙන බැවින් ඒ සඳහා වැඩ අධිකාරි තුමාට අවශ්‍ය කාර්ය මණ්ඩලය ප්‍රමාණවත්දැයි විමසන ලදී.

11. **ගරු සභාපතිතුමාගේ අදහස් දැක්වීම.**

කොවිඩ් 19 මුල් අවස්ථාවේදී පූර්වාදර්ශයක් මුළු ලංකාවටම නොතිබුණු අවස්ථාවක බළන්ගොඩ නගර සභාවේ කාර්ය මණ්ඩලය එක්ව ක්‍රියාත්මක වී කොවිඩ් 19 ව්‍යාප්තිය වැළැක්වීම සඳහා කටයුතු කළ බව ද ජනාධිපති කාර්ය සාධක බලකාය ද අප සභාව ආදර්ශයට ගත් බවද සියළු දෙනා එක් වී විශාල වැඩ කොටසක් සිදු කර බළන්ගොඩ නගරය රැක ගත් නමුත් ඒ වන විට රජයේ තිබූ ප්‍රතිචාරය මෙවර සෑහෙන්න පහළ මට්ටමක තිබෙන බව ද මේ නිසා ගියවර සිදුකල පරිදි ඕනෑකමින් හා වගකීමෙන් මෙවර කටයුතු කිරීමට නොහැකි වී ඇති බව ද සඳහන් කළේය. එමෙන්ම රටේ සිටින පූජ්‍ය පක්ෂය හා විද්වත් පිරිස මාධ්‍ය හරහා ජනතාව දැනුවත් කරන බවත්, ඒ පිළිබඳ වගකීම සෞඛ්‍ය අංශයට ලබා නොදී ආරක්ෂක අංශය වෙත ලබා දී ඇති අතර පළාත් පාලන ආයතන අතරින් බළන්ගොඩ නගර සභාව කළ සේවාව වෙනුවෙන් කිසිදු ඇගයීමක් සිදු නොකළ නමුත් අප කළ කාර්යය දැක ඒ අනුව වැඩ කළ ආයතන සඳහා ඇගයීමක් ලැබුණු බවත් පැවසීය. අද වන විට ගියවර මෙන් වගකීමක් ගැනීමට සභාවට නොහැකි වී ඇති අතර මූලික වී කටයුතු කිරීමට කිසිදු ආයතනයක් නොමැති නමුත්